# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 12,796 — 1961 දෙසැම්බර් 7 වැනි බ්‍රහස්පතින්ද — 7.12.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## මිළ පාලන දැන්වීම්

**අංක ඇ/ප්සී/වී/ඇස්ඇප් 9 (3) දරණ මිළ නියෝගය** — **ශුද්ධ කළ සුදු සීනි**

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

#### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සතරසිංහගේ දෙන් සුගතදස වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) වැනි වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1961 අගෝස්තු මස 2 වැනි දිනය හා 12,568 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1961 ජූලි මස 29 වැනි දිනය හා ඇ/ප්සී/වී/ඇස්ඇප් 9 (2) වැනි අංකය දරණ මිළ නියෝගය මේ දුන් පටන් මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛණයේ 2 වැනි හා 3 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් ශුද්ධ කළ සුදු සීනි තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් ද, සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් ද එම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත මේ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සීනි වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) සීනි පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) සීනිවලට මොනම වර්ගයකවුත් හකුරු අයිති නැති බවත් ;

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බවත්,

(5) මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, යම් ස්ථානයක හෝ වාහනයක සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකු ම එම ප්‍රදේශයේ සීනි සම්බන්ධයෙන් නියමිත මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ එකී වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතු බවත්,

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සීනි තොග වශයෙන් හෝ සිල්ලර වශයෙන් විකුණන සෑම වෙළෙන්දෙකු විසින් ම සීනි මිළයට ගනු ලබන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර ඇතුළත් කුවිතාන්සියක් නිකුත් කළ යුතු බවත් මෙයින් නියම කරමි, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) සීනි විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) සීනි විකුණූ ප්‍රමාණයට ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වගත්ය.

1961 දෙසැම්බර් මස 4 වැනි දින පෙරවරු 9 ට කොළඹ කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ඇස්. ඩී. සුගතදස,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක.

2219—ජේ. ඇන්. ආර් 243—6,350 (12/61)

## උපලේඛනය

ශුද්ධ කළ සුදු සීනි

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. හාපිටිගම් කෝරළය ... ... ... ... | 66 97 | 0 62 |
| 2. අළුත්කුරු කෝරළය උතුර "ඒ" — | | |
| (අ) මීගමුව ... ... ... ... | 65 98 | 0 62 |
| (ආ) කොච්චිකඩේ ... ... ... ... | 66 50 | 0 62 |
| 3. අළුත්කුරු කෝරළය දකුණ ... ... ... ... | 65 98 | 0 62 |
| 4. අළුත්කුරු කෝරළය උතුර "බී" — | | |
| (අ) මිනුවන්ගොඩ ... ... ... ... | 66 50 | 0 62 |
| (ආ) දිවුලපිටිය ... ... ... ... | 66 47 | 0 62 |
| 5. සියනෑ කෝරළයේ බස්නාහිර (මැද පත්තුව) ... ... ... | 66 76 | 0 62 |
| 6. සියනෑ කෝරළයේ බස්නාහිර (අදිකාරි පත්තුව) — | | |
| (අ) මහර සහ බොල්ලෑගල ... ... ... ... | 65 90 | 0 62 |
| (ආ) උඩුපිල ... ... ... ... | 66 0 | 0 62 |
| 7. සියනෑ කෝරළය නැගෙනහිර— | | |
| (අ) නිට්ටඹුව ... ... ... ... | 66 48 | 0 62 |
| (ආ) දොම්පෙ සහ පූගොඩ ... ... ... ... | 67 02 | 0 62 |
| 8. හේවාගම් කෝරළය— | | |
| (අ) කඩුවෙල සහ හෝමාගම ... ... ... | 66 70 | 0 62 |
| (ආ) පාදුක්ක ... ... ... ... | 66 88 | 0 62 |
| (ඇ) හන්වැල්ල ... ... ... ... | 66 80 | 0 62 |
| (ඈ) වග සහ අවිස්සාවේල්ල ... ... ... | 66 92 | 0 62 |
| 9. සල්පිටි කෝරළය ... ... ... ... | 66 50 | 0 62 |
| 10. කොළඹ ආදයම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාවෙන් පිට ... ... ... ... ... | 66 65 | 0 62 |

සැලකිය යුතුයි.—ඉහත සඳහන් මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය.

12—601

---

ඇෆ්පී/ඩී-ඇස්.ඇෆ්. 1 (39) අංකය දරණ මිල නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය
(උම්බලකඩ හෝ බොනිටෝෆිෂ්)

## 1950 අංක 29 දරන මිල පාලන පනත

### නියෝගය

කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් සතරසිංහගේ දෙන් සුගතදස වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

1. 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්වුන මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ තොග වෙළෙන්දෙකුට තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් දළබර හොණ්ඩරයක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම මිළ ගණන්වලට මෙයට යාකල උපලේඛනයේ තුන්වන තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ දෙවෙනි තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි වැඩිම තොග මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

2. 1950 අංක 29 දරණ මිළ පාලන පනත යටතේ සකස්වුන මිළ නියෝගයන් අනුව කොළඹ නාගරිකයේ සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ශුද්ධබර රාත්තලක් එම ප්‍රදේශයේ විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන්වලට මෙය යාකළ උපලේඛනයේ හතරවෙනි තීරයේ සඳහන් ගණන් එකතු කිරීමෙන් එම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් පෙදෙස්වල එම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් විකිණිය හැකි වැඩිම සිල්ලර මිළ ගණන් ගත යුතු බව මෙයින් නියම කරමි.

3. තවද, මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියම කරමි.

4. එසේම, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකට, උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

5. තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ පළමුවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම එවැනි උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිල පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට එකී උම්බලකඩ හෝ බොනිටෝෆිෂ් හා නියමිත වැඩිම මිල ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

6. එසේම මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා "රාත්තල" හෙවත් "රා" යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

7. තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝිපිෂ් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙක්ම හා උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝිපිෂ් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිලයට ගන්නා ඉල්ලුවහොත්, පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය;

(ආ) උම්බලකඩ හෝ බොනිටෝිපිෂ් විකුණූ ප්‍රමාණය (බර අනුවයි);

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළඳාමේ සවභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් මිලයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

8. උපලේඛනයේ පළවෙනි තීරයේ සඳහන් උම්බලකඩ හෝ බොනිටෝිපිෂ් විකුණන විට ඒවා විකුණනු ලබන ද්‍රව්‍ය යම් කිසි දෙයක ඔතනු ලැබෙනම් එහි මිලත් එම උපලේඛනයේ තුන්වෙනි හා හතරවෙනි තීරවල සඳහන් වැඩිම මිල ගණන්වලට ඇතුලත්වන බවද නියම කරමි.

1961 දෙසැම්බර් මස 2 වෙනි දින පෙරවරු 10 ට කොළඹ කච්චේරියේදී අත්සන් තබන ලදී.

ඇස්. ඩී. සුගතදස,
කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන.

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| වර්ගය | ප්‍රදේශය | තොග වෙළෙන්දෙකු විසින් දලබර හොන්ඩරයක් තොග වශයෙන් කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම තොග මිල | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලරට කොළඹ නගරයට වඩා වැඩියෙන් විකිණිය හැකි වැඩිම සිල්ලර මිල |
| | | රු. ශ. | රු. ශ. |
| උම්බලකඩ හෝ බොනිටෝිපිෂ් ... | 1. හාපිටිගම් කෝරලය ... ... | 4 00 ... | 0 04 |
| | 2. අලුත්කුරු කෝරලය උතුර ''ඒ'' ... | 3 76 ... | 0 04 |
| | 3. අලුත්කුරු කෝරලය උතුර ''බී'' ... | 3 78 ... | 0 04 |
| | 4. අලුත්කුරු කෝරලය දකුණ ... | 3 50 ... | 0 04 |
| | 5. සියනෑ කෝරලය නැගෙනහිර ... | 3 80 ... | 0 04 |
| | 6. සියනෑ කෝරලය බටහිර (අධිකාරි පත්තුව) | 3 48 ... | 0 04 |
| | 7. සියනෑ කෝරලය බටහිර (මැද පත්තුව) ... | 3 64 ... | 0 04 |
| | 8. හේවාගම් කෝරලය ... ... | 3 62 ... | 0 04 |
| | 9. සල්පිටි කෝරලය ... ... | 3 54 ... | 0 04 |
| | 10. කොළඹ ආදායම් පාලන නිලධාරි තැනගේ කොට්ඨාශය (කොළඹ නාගරික සීමාවෙන් පිට) ... ... ... | 3 44 ... | 0 04 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

12—599

---

අංක 36 දරණ ආහාර මිළ නියෝගය — දුඹුරු සීනි

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් සංගරපිල්ලෙයි කදිර්කාමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තිය යටතේ මාවෙත පැවරී ඇති බලතල අනුව—

(1) 1960 ජනවාරි 4 වැනි දින හා අංක 12,029 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1959 දෙසැම්බර් 30 වැනි දින හා අංක එච්. 34 දරණ මාගේ ආහාර මිළ නියෝගයේ 2 (අ) දරණ ඡෙදය මගින් යළි පැන වූ, 1959 මැයි මස 29 වැනි දින හා අංක 11,753 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පල කරණ ලද, 1959 මැයි මස 19 වැනි දින හා අංක 27 දරණ දුඹුරු සීනි පිළිබඳ මගේ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි.

(2) තොග වශයෙන් විකිණීමේ දී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වශයෙන් විකිණීමේ දී බර රාත්තලක් ද විකුණනු ලබන මෙහි දක්වෙන 1 වන උපලේඛනයේ විස්ත්‍ර සඳහන් සීනි, 2 වන උපලේඛනයේ 2 වන තීරයේ සහ 3 වන උපලෙබනයේ 2 වන තීරයේ සඳහන් මිළ ගණන් සීනි විකිණීමේදී අනුපිළිවෙලින් තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බවද හම්බන්තොට ආදායම් දිස්ත්‍රික්කය තුළ සීනි ඊට වැඩි ගණනකට නොවිකිණිය යුතු බව ද නියෝග කරමි.

(3) මීට යාකර ඇති 1 වන උපලේඛනයේ විස්තර කරනු ලබන සීනිවලට මෙම නියෝගයේ වගන්ති බලපවත්වනු ලබන බව නියෝග කරමි.

(4) මෙම නියෝගයේ කාය්‍යී සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;

(ආ) සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ඇ) දුඹුරු සීනි විකුණන විට එය යම් කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙය්ක් වෙතොත් එහි මිළත් මීට යාකර ඇති 2 වන උපලේඛනයේ 2 වැනි තීරයේ සහ 3 වන උපලේඛනයේ 2 වන තීරයේ සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වී ඇති බවත්,

(ඈ) '' සීනි '' යන්නෙන් සියළුම හකුරු වර්ග අත්හැර සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(5) මීට යාකර ඇති 1 වන උපලේඛනයේ සඳහන් මොනම වර්ගයක හෝ ශ්‍රෙණියක හෝ සීනි වෙන මොනයම් ද්‍රව්‍යයන් හෝ වෙන මොනයම් බාල වර්ගයේ ද්‍රව්‍යයක් හෝ මිශ්‍රකර කිසිම වෙළෙන්දෙක් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක දුඹුරු සීනි සිය සවාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ සීනි වලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සීනිවල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක ලියා එම පුවරුව එම භාජනයට ඇඳ එම සීනිද මිළ පුවරුවද ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(7) මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 1 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුල මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් විස්තර සහ ශ්‍රේණිය සීනි විකුණනු ලබන සෑම වෙළෙන්දෙක්ම ඒ ද්‍රව්‍යය මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,
(ආ) විකුණූ සීනි ප්‍රමාණය,
(ඇ) විකුණූ සීනිවල විස්තර සහ ශ්‍රේණිය,
(ඈ) විකුණූ සීනි ප්‍රමාණයට ගෙවූ මුදල,
(ඉ) වෙළඳමේ ස්වභාවය, එනම් වෙළඳම තොග වශයෙන්ද නැතිනම් සිල්ලර වශයෙන්ද යන වග ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බව නියෝග කරමි.

1961 දෙසැම්බර් මස 4 වැනි දින පෙරවරු 9 ට හම්බන්තොට දී අත්සන් කරණ ලදී.

ඇස්. කදිර්කාමනාදන්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

## 1 වන උප ලේඛනය

සීනිවල විස්තර සහ ශ්‍රේණිය : දුඹුරු සීනි

## 2 වන උප ලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| 1. වලස්මුල්ල ... ... ... ... | 60 00 |
| 2. අම්බලන්තොට ... ... ... ... | 60 00 |
| 3. හම්බන්තොට ... ... ... ... | 60 00 |
| 4. තිස්ස ... ... ... ... | 60 20 |
| 5. තංගල්ල ... ... ... ... | 59 70 |
| 6. බෙලිඅත්ත ... ... ... ... | 59 73 |
| 7. දෙද්දුවාවල ... ... ... ... | 59 73 |
| 8. මහවෙල ... ... ... ... | 59 70 |
| 9. වීරකැටිය ... ... ... ... | 60 00 |
| 10. කිරම ... ... ... ... | 60 00 |
| 11. මිද්දෙනිය ... ... ... ... | 60 00 |
| 12. හුංගම ... ... ... ... | 60 00 |

## 3 වන උප ලේඛනය

| 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී රාත්තලක වැඩිම මිළ<br>ශත |
|---|---|
| 1. බටහිර ගිරුවා පත්තු ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශය ... ... | 57 |
| 2. නැගෙනහිර ගිරුවා පත්තුව සහ මාගම් පත්තු ප්‍රාදේශිය ආදයම් නිලධාරි කොට්ඨාශ | 58 |

**සැලකිය යුතුයි.**—මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා එම ද්‍රව්‍ය විකිණීමේ වැඩිම මිළ වේ. එහි මිලට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

12-602/1

---

අංක 37 දරණ ආහාර මිළ නියෝගය — සීනි

## වර්ෂ 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන්පත් සංගරපිල්ලෙයි කදිර්කාමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3(2) දරණ වගන්තිය සමග කියවියයුතු 4 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව—

(i) 1961 සැප්තැම්බර් මස 19 වැනි දින සහ අංක 12,665 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1961 සැප්තැම්බර් මස 15 වැනි දින සහ අංක 35 දරණ හම්බන්තොට ආදයම් දිස්ත්‍රික්කය තුල තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් සීනි විකිණිය හැකි වැඩිම මිළ පිළිබඳ මාගේ ආහාර මිළ නියෝගය මේ මොහොතේ සිට මෙයින් අවලංගු කරමි.

(ii) තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් ද සිල්ලර වශයෙන් විකිණීමේදී බර රාත්තලක් ද විකුණනු ලබන මෙහි දක්වෙන 1 වන උප ලේඛනයේ විස්තර සඳහන් සීනි, 2 වන උප ලේඛනයේ 2 වැනි තීරයේ සහ 3 වන උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් මිළ ගණන් සීනි විකිණීමේදී අනුපිලිවෙලින් තොග වශයෙන් සහ සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව ද හම්බන්තොට ආදයම් දිස්ත්‍රික්කය තුල සීනි ඊට වැඩි ගණනකට නොවිකිණිය යුතු බව ද නියෝග කරමි.

(iii) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ විස්තර කරණු ලබන සීනිවලට මෙම නියෝගයේ වගන්ති බල පවත්වනු ලබන බව නියෝග කරමි.

(iv) මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සීනි දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් හෝ කොයි අන්දමකට හෝ විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;
(ආ) සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර විකිණීමක් ලෙස සලකනු ලබන බවත් ;
(ඇ) සුදු සීනි විකුණන විට එය යම් කිසි දෙයක බහා හෝ ඔතා දෙන දෙයක් වෙතොත් එහි මිළත් මීට යාකර ඇති 2 වන උප ලේඛනයේ 2 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුලත් වී ඇති බවත් ;
(ඈ) '' සීනි '' යන්නෙන් සියලුම හකුරු වර්ග අත්හැර සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(v) මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් මොනම වර්ගයක හෝ ශ්‍රෙණියක හෝ සීනි වෙන මොනයම් ද්‍රව්‍යයක් හෝ වෙන මොනයම් බාල වර්ගයේ ද්‍රව්‍යයක් හෝ මිශ්‍ර කර කිසිම වෙළෙන්දෙක් නොවිකිණිය යුතු බව නියම කරමි.

(vi) තවද මෙම නියෝගයේ වැඩිම මිළ ගණන් නියම කරණු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක සුදුසීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ සීනිවලින් ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ සීනිවල මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක ලියා එම පුවරුව එම භාජනයට ඇඳා එම සීනි ද මිළ පුවරුවද, මිනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව මෙයින් නියම කරමි.

(vii) මීට යාකර ඇති දෙවන උප ලේඛනයේ 1 වන තීරයේ සහ 3 වන උප ලේඛනයේ 1 වන තීරයේ සඳහන් ප්‍රදේශයන් තුල මීට යාකර ඇති 1 වන උප ලේඛනයේ සඳහන් විස්තර සහ ශ්‍රෙණියේ සීනි විකුණනු ලබන සෑම වෙළෙන්දෙක්ම ඒ ද්‍රව්‍ය මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ සීනි ප්‍රමාණය ;
(ඇ) විකුණූ සීනිවල විස්තර සහ ශ්‍රෙණිය ;—
(ඈ) විකුණූ සීනි ප්‍රමාණයට ගෙවූ මුදල ; සහ
(ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද, නැතිනම් සිල්ලර වශයෙන් ද යන වග ඇතුලත් කුවිතාන්සියක් දිය යුතු බව නියෝග කරමි.

1961 දෙසැම්බර් මස 4 වැනි දින පෙරවරු 9ට, හම්බන්තොට දී අත්සන් කරණ ලදී.

ඇස්. කදිර්කාමනාදන්,
නියෝජ්‍ය (ආහාර) මිළ පාලක තැන,
හම්බන්තොට දිස්ත්‍රික්කය.

## 1 වන උපලේඛනය

සීනිවල විස්තර සහ ශ්‍රෙණිය—සුදුසීනි

## 2 වන උපලේඛනය

| | 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. | වලස්මුල්ල ... ... | 68 0 |
| 2. | කිරම ... ... ... | 68 0 |
| 3. | මිද්දෙනිය ... ... | 68 0 |
| 4. | අම්බලන්තොට ... ... | 67 50 |
| 5. | දෙද්දුවාවෙල ... ... | 67 48 |
| 6. | කංගල්ල ... ... ... | 67 48 |
| 7. | බෙලිඅත්ත ... ... | 67 48 |
| 8. | මහවෙල ... ... | 67 48 |
| 9. | වීරකැටිය ... ... ... | 68 0 |
| 10. | තිස්ස ... ... ... | 68 0 |
| 11. | හම්බන්තොට ... ... | 67 50 |
| 12. | හුංගම ... ... ... | 67 50 |

## 3 වන උපලේඛනය

| | 1 වන තීරය<br>ප්‍රදේශය | 2 වන තීරය<br>සිල්ලර වශයෙන් විකිණීමේදී රාත්තලක වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|---|
| 1. | බටහිර ගිරුවා පත්තු සහ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශය ... ... ... | .0 64 |
| 2. | නැගෙනහිරු ගිරුවා පත්තුව සහ මාගම් පත්තු ප්‍රාදේශීය ආදායම් නිළධාරි කොට්ඨාශ ... ... | 0 65 |

සැලකිය යුතුයි .—මෙ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා එම ද්‍රව්‍ය විකිණීමේ වැඩිම මිළ වේ. එහි මිළට වැඩියෙන් නොවිකිණිය යුතුය.

12–602/2

---

1961 අංක ඇම් ඇන්/11 දරණ ආහාර මිළ නියෝගය — සීනි

## 1950 හේ අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර් (ආහාර) මිළ පාලක තැන්පත් සන්මුගම් පරමනාදන් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවෙන 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1961 අගෝස්තු මස 2 වෙනි දින අංක 12,568 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද 1961 ජූලි මස 28 වෙනි දිනය හා ඇම්ඇන්/9 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය මේ දුන් පටන් මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති 1 වෙනි උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල පිළිවෙලින් සඳහන් ශුද්ධ කළ සුදු සීනි සහ දුඹුරු පාට සීනි, 1961 දෙසැම්බර් මස 4 වෙනි දින පූර්වභාග 9.00 සිට තොග වෙළෙන්දකු විසින් සිල්ලර වෙළෙන්දන්ට තොග වශයෙන් විකිණීමේදී දළබර හොණ්ඩරයක් එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) මීට යාකර ඇති 2 වෙනි උපලේඛනයේ 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් ශුද්ධ කළ සුදු සීනි සහ දුඹුරු පාට සීනි, 1961 දෙසැම්බර් මස 4 වෙනි දින පූර්වභාග 9.00 සිට සිල්ලර වෙළෙන්දකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක මිළ එම උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශවල මේ දුන් පටන් විකිණිය හැකි වැඩිම මිළ බව මෙම නියෝගයෙන් නියම කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්‍ය සඳහා—

(අ) සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ සීනි වරකට ශුද්ධ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) සීනි ඕනෑම ප්‍රමාණයක් පාරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ ශුද්ධ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ඇ) ''සීනි'' සියලුම වර්ගයේ හකුරුත් ඇතුළත් බවද, මෙම නියෝගයෙන් නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සීනි වෙනත් ද්‍රව්‍යයක් සමඟ මිශ්‍ර කොට බාල කිරීමෙන් නොවිකිණිය යුතු බවද නියම කරමි.

(6) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක හෝ සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දකුම සීනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත මිළ ඕනෑම ගනුදෙනු කාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබිය යුතු බව නියම කරමි.

(7) තවද, මෙම නියෝගයේ කාර්‍ය සඳහා ''රාත්තල'' හෙවත් ''රා'' යන්නෙන් සලකනු ලබන්නේ ඇවැර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද, මෙම නියෝගයේ වැඩිම මිළ නියම කරනු ලබන සෑම ප්‍රදේශයකම සීනි තොගවශයෙන් විකුණන සෑම තැනැත්තෙකුම සහ සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුව හොත්, පහත සඳහන් විස්තර, එනම්:—

(අ) විකුණූ දිනය ;

(ආ) විකුණූ සීනි ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ සීනි වර්ගය, ශුද්ධකළ සුදු සීනිද? දුඹුරු පාට සීනිද? යන බව මෙහි සඳහන් කළ යුතුය ;

(ඈ) විකුණූ සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල සහ ;

(ඉ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම සිල්ලර වශයෙන්ද තොග වශයෙන්ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(9) සීනි විකිණීමේදී යම් දෙයක ඔතනු ලැබේ නම් හෝ බහාලනු ලැබේ නම් හෝ එහි මිළත් 1 වෙනි සහ 2 වෙනි උපලේඛනවල 2 වෙනි සහ 3 වෙනි තීරවල සඳහන් මිළ ගණන් වලට ඇතුළත් බවද නියම කරමි.

1961 දෙසැම්බර් මස 4 වෙනි දින පූර්වභාග 9.0 ට මන්නාරම් කොටුවේ ආහාර පාලන කාර්‍යාලයේදී අත්සන් කරන ලදී.

(ඇස්. පරමනාදන්),
මන්නාරම් දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

ආහාර පාලන කාර්‍යාලය,
කොටුව, මන්නාරම.
4.12.1961.

## 1 වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශ | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| | තොග වෙළෙන්දකු විසින් දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
| | ශුද්ධ කළ සුදු සීනි<br>රු. ශ. | දුඹුරු පාට සීනි<br>රු. ශ. |
| මන්නාරම් සුළු නගර සීමාව තුළ ... ... ... ... ... | 69.27 | 61.50 |
| ගම් කාර්‍ය සභා සීමාවන් තුළ— | | |
| නානාඩ්ඩන් නැගෙනහිර ... ... ... ... ... | 69.12 | 61.35 |
| මුසලි දකුණ ... ... ... ... ... ... | 69.27 | 61.50 |

## 2 වෙනි උපලේඛනය

| 1 වෙනි තීරය<br>ප්‍රදේශය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය |
|---|---|---|
| | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
| | ශුද්ධ කළ සුදු සීනි<br>ශ. | දුඹුරු පාට සීනි<br>ශ. |
| මන්නාරම් සුළු නගර සීමාව තුළ ... ... ... ... ... | 65 | 58 |
| ගම් කාර්‍ය සභා සීමාවන් තුළ— | | |
| මන්නාරම නැගෙනහිර ... ... ... ... ... | 65 | 58 |
| ඉරුකුලම්පිට්ටි ... ... ... ... ... | 65 | 58 |
| මන්නාරම බටහිර (කලේමන්නාරම් ගම්මුලාදෑනි ප්‍රදේශය හැර) ... ... ... | 65 | 58 |
| වන්කාලෙයි ... ... ... ... ... ... | 65 | 58 |
| මාන්තෙ දකුණ ... ... ... ... ... ... | 65 | 58 |
| මාන්තෙ උතුර ... ... ... ... ... ... | 66 | 59 |
| පෙරුන්කාලිපත්තු (පෙරියමඩු ජනපදය හැර) ... ... ... ... | 66 | 59 |
| මන්නාරම බටහිර (කලේමන්නාරම් ගම්මුලාදෑනි ප්‍රදේශය) ... ... ... | 66 | 59 |
| පෙරුන්කාලිපත්තු (පෙරියමඩු ජනපදය) ... ... ... ... | 67 | 60 |
| ඉල්ලුපකඩවෙයි ... ... ... ... ... ... | 66 | 59 |
| නානාඩ්ඩන් නැගෙනහිර ... ... ... ... ... | 65 | 58 |
| නානාඩ්ඩන් බටහිර ... ... ... ... ... | 65 | 58 |
| මුසලි දකුණ (මරිච්චකඩ්ඩි ගම්මුලාදෑණි ප්‍රදේශය හැර) ... ... ... | 66 | 59 |
| මුසලි දකුණ (මරිච්චකඩ්ඩි ගම්මුලාදෑණි ප්‍රදේශය) ... ... ... ... | 67 | 60 |
| පනන්කාමම් ... ... ... ... ... ... | 67 | 60 |
| මේන්කුමුලෙයි ... ... ... ... ... ... | 67 | 60 |
| මුසලි උතුර ... ... ... ... ... ... | 66 | 59 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය. මේ මිළ ගණන් වලට ඉහළින් ඒ ද්‍රව්‍යය විකිණිය නොහැක.

වී. 73 වැනි ආහාර මිළ නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය (සුදු සීනි)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

වවුනියා දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් පරමනාදන් වෙල්වරත්නම් වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පණතේ 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු 4 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලකල අනුව—

(1) 1961–8–1 වන දින, අංක 12,567 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 61–7–28 දින අංක වී 73 දරණ අතිරේක ආහාර ද්‍රව්‍ය පිළිබඳ මිළ නියෝගය මේ දුන් පටන් මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මීට යාකර ඇති උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක් වවුනියා දිස්ත්‍රික්කුයේ සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ, මේ දුන් පටන්, මේ උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් කර තිබෙන මිළ ගණන් බවද, -

(3) මීට යාකර ඇති උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී සුද්ද බර රාත්තලක් වවුනියා දිස්ත්‍රික්කයේ සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිළ, මේ දුන් පටන්, මේ උපලේඛනයේ 3 වැනි තීරයෙහි සඳහන් කර තිබෙන මිළ ගණන් බවද, මෙම නියෝගයෙන් නියෝග කරමි.

(4) තවද මෙම නියෝගයේ කාර්‍යය සඳහා—

(අ) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍ය ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් ආහාර ද්‍රව්‍යයක් වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත්,

(ආ) උපලේඛනයේ පළමුවන තීරයෙහි සඳහන් ආහරා ද්‍රව්‍යයක් පාරිභොගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස නළකනු ලබන බවත්, මෙම නියෝගයෙන් නියෝග කරමි

(5) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ආහාර ද්‍රව්‍යයක් අන්‍ය ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීම බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යයන් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබා ගෙන සිටින සෑම වෙළෙන්දෙකුම ඒ ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා ඒ ආහාර ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම්වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට ඒ ආහාර ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගණු දෙනු කාරයෙකුට පැහැදිළිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(7) එසේම මෙම නියෝගයේ කාර්‍යය සඳහා ''රාත්තල'' හෙවත් ''රා.'' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(8) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ආහාර ද්‍රව්‍යය තොග වශයෙන් විකුණන සෑම තැනත්තෙකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනත්තෙකු විසින් ද මිළයට ගන්නා ඉල්ලුව හෝත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය,
(ආ) ආහාර ද්‍රව්‍යය විකුණූ ප්‍රමාණය (බර අනුව),
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,
(ඈ) වෙළඳාමේ සොභාවය ; එනම්, වෙළඳාම තොග වශයෙන් ද, සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුයිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(9) නියමිත ආහාර ද්‍රව්‍යය විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ දෙවනි, තුන්වැනි, හතර වැනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන්වලට ඇතුළත් වන බවද නියම කරමි.

පී. වෙල්වරත්නම්,
සහකාර මිළ (ආහාර) පාලක තැන, වවුනියා දිස්ත්‍රික්කය.

1961 දෙසැම්බර මාසයේ 4 වැනි දින, පස්වරු 2 ට වවුනියාවේ කච්චේරියේ දී අත්සන් තබන ලදී.

### උපලේඛනය

| 1 වැනි තීරය<br>වර්ගය | 2 වැනි තීරය<br>ශුද්ධ බර හොණ්ඩරයක වැඩිම මිළ<br>රු. ශ. | 3 වැනි තීරය<br>ශුද්ධ බර රාත්තලක වැඩිම සිල්ලර මිළ<br>රු. ශ. |
|---|---|---|
| සුදු සීනි ... ... ... | 68 53 ... | 0 65 |

**සැළකිය යුතුයි.**—ඉහත සඳහන් මිළ ගණන් එකී ද්‍රව්‍යය විකිණිය යුතු නියම මිළ නොවේ. එහි සඳහන් ද්‍රව්‍යයන් විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය.

12–589

---

අංක. අ 87 දරණ ආහාර මිළ නියෝගය

සීනි (සුදු)

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන්පත් ටියුඩර් කරුණාතිලක දසනායක, වන මම, 1950 අංක 29 දරන මිළ පාලන පනතේ 3 (2) යන වගන්තිය සමඟ කියවිය යුතු 4 වැනි වගන්තියෙන් මට පැවරී තිබෙන බලතල අනුව :—

(i) 1961 අගෝස්තු 1 වෙනි දිනය හා අංක. 12,567 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1961 ජූලි 28 වෙනි දින සහ අංක අ. 80 දරණ සීනි (සුදු) පිළිබඳ ආහාර මිළ නියෝගය මේ දුන් සිට අවලංගු කරමි.

(ii) 1959 මාර්තු 23 වෙනි දිනය හා අංක 11,706 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1959 මාර්තු 21 වෙනි දිනය හා අංක අ. 51 දරණ සීනි (සුදු) පිළිබඳ ආහාර මිළ නියෝගය මේ දුන් පටන් යළිත් පනවමි.

1961 දෙසැම්බර් මස 4 වෙනි දින පෙරවරු 8.55 ට අනුරාධපුර කච්චේරියේ දී අත්සන් කරන ලදී.

ටී. කේ. දසනායක,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර මිළ (ආහාර) පාලක තැන..

12–592

ආර්/20/1961 වෙනි අංකය දරණ ආහාර මිළ නියෝගය — සුදු සීනි

## 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන්පත් හේවා ඩැනී වීරරත්න වන මම, 1950 අංක 29 දරණ මිළ පාලන පනතේ 3 (2) දරණ වගන්තිය සමඟ කියවිය යුතු 4 වෙනි වගන්තිය යටතේ මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1961 අගෝස්තු මස 2 වෙනි දින අංක 12,568 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1961 ජුලි මස 28 වෙනි දින අංක ආර්/14/1961 දරණ මගේ ආහාර මිළ නියෝගය අද දින සිට මෙයින් අවලංගු කරමි.

(2) සුදු සීනි තොග වශයෙන් විකිණීමේදී දළ බර හොණ්ඩරයක්ද සිල්ලර වශයෙන් විකිණීමේදී බර රාත්තලක් ද, මෙ උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ප්‍රදේශයන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ දන් පටන් මෙහිම 2 වෙනි, 3 වෙනි තීරයන්හි පිළිවෙලින් සඳහන් කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ වාහනයක හෝ සීනි සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුම සීනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍යය සඳහා මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ උසින් අඟලකට වඩා අඩුනොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනයට සම්බන්ධකොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ හෝ තැබියයුතු බව නියම කරමි.

(4) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරන ලද සෑම ප්‍රදේශයකම සුදු සීනි වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාලකොට කිසිවකු විසින් නොවිකිණිය යුතුබව නියම කරමි.

(5) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යනුවෙන් සළකනු ලබන්නේ ඇවර්දුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(6) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම සුදු සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම් :—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ සුදු සීනි ප්‍රමාණය (බර අනුවයි) ;
(ඇ) විකුණූ සුදු සීනි ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ; සහ
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, වෙළඳාම තොග වශයෙන්ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(7) තවද මෙම නියෝගයේ කාර්‍ය්‍ය සඳහා—

(අ) සුදු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ වරකට සුදු සීනි දළ බර හොණ්ඩරයකට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමකට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;
(ආ) සුදු සීනි පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සළකනු ලබන බවත් ;
(ඇ) '' සුදු සීනි '' යන්නෙන් සියලුම හකුරු වර්ග අත්හැර සළකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(8) සුදු සීනි විකුණන විට එය යම්කිසි දෙයක ඔතා හෝ බහා දෙන දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 2 වෙනි හා 3 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1961 දෙසැම්බර් මස 4, වෙනි දින පෙරවරු 9 ට රත්නපුර කච්චේරියේදී අත්සන් තබන ලදී.

එච්. ඩී. වීරරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ සහකාර (ආහාර) මිළ පාලක තැන.

### උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය |
|---|---|---|
| ප්‍රදේශය | තොග වෙළෙන්දෙකු විසින්තොග වශයෙන් දළබර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිමමිළ (සුදු සීනි) රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් සිල්ලර වශයෙන් බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ (සුදු සීනි) රු. ශ. |
| (1) (අ) රත්නපුර පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය ... ... ...<br>(ආ) ගවරගිරිය වසම හැර කුකුළු කෝරලේ පල්ලේ පත්තුව ... ...<br>(ඇ) එරත්න, ගිලීමලේ උතුරු ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදෑනි වසම් හැර කුරුවිටි කෝරලේ උඩ පත්තුව සහ කරඳන සහ කලටුවාව නැගෙනහිර යන ගම්මුලාදෑනි වසම් | 67 0 ... | 0 62 |
| (2) කලටුවාව නැගෙනහිර ගම්මුලාදෑනි වසම හැර කුරුවිටි කෝරලේ පල්ලේ පත්තුව සහ කරඳන ගම්මුලාදෑනි වසම හැර කුරුවිටි කෝරළේ මැද පත්තුව ... ... ... | 67 0 ... | 0 62 |
| (3) (අ) නවදුන් කෝරලේ උඩ පත්තුව, මැද පත්තුව, සහ පල්ලේ පත්තුව ...<br>(ආ) කුකුළු කෝරලේ මැද පත්තුව ... ... ... | 67 50 ... | 0 63 |
| (4) (අ) බලන්ගොඩ පළාත් ආණ්ඩු සභා ප්‍රදේශය ...<br>(ආ) රක්වාන සුළු නගර සභා ප්‍රදේශය ... ... ...<br>(ඇ) කුරුවිටි කෝරලේ එරත්න, ගිලීමලේ උතුර, ගිලීමලේ දකුණ සහ කුඩාව යන ගම්මුලාදෑනි වසම් ... ... ...<br>(ඈ) කල්තොට, වසම හැර කඩවත මැද කෝරලේ හෙල පල්ලේ පළාත හෙලඋඩපළාත; සහ උඩුවග්ගම්පත්තුව ... ... ... ...<br>(ඉ) අටකලං කෝරලේ පන්නිල් පත්තුව, මැද පත්තුව සහ පල්ලේ බැද්ද ගම්මුලාදෑනි වසම<br>(ඊ) කුකුළු කෝරලේ උඩ පත්තුව සහ ගවරගිරිය ගම්මුලාදෑනි වසම ... | 67 25 ... | 0 63 |
| (5) (අ) කොළොන්නා කෝරලේ කොළොන්නාගම් පත්තුව සහ දියපොට ගම් පත්තුව<br>(ආ) කඩවත කෝරලේ තල්පිටිගම් පත්තුව ... ...<br>(ඇ) අටකලංකෝරලේ පල්ලේ බැද්ද ගම්මුලාදෑනි වසම හැර දෙපත්තුව ...<br>(ඈ) මැද කෝරලේ කල්තොට වසම ... ... ... | 67 50 ... | 0 63 |

සැලකිය යුතුයි.—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍යය විකිණිය හැකි වැඩිම මිළ වේ. එකී මිළට වැඩියෙන් නොවිකිණිය යුතුයි.

# ලංකා මහා බැංකුවේ දැන්වීම්

## ශ්‍රී ලංකා මහ බැංකුව

**1961 නොවැම්බර් 30 වැනි දිනට ශේෂපත්‍රය**

(1949 අංක 58 දරන මුදල් නීති පනතේ **34** වැනි වගන්තියට අනුව.)

**වගකීම**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| ප්‍රාග් ධන ගිණුම | | | | |
| ප්‍රාග් ධනය ... | 1,50,00,000 | 0 | | |
| අතිරික්තය ... | 2,50,00,000 | 0 | | |
| | | | 4,00,00,000 | 0 |
| වගකීම් | | | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු | 68,25,62,722 | 60 | | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 3,57,05,306 | 17 | | |
| | | | 71,82,68,028 | 77 |
| තැන්පත් | | | | |
| රජය ... ... | 2,60,511 | 37 | | |
| රාජ්‍ය නියෝජ්‍යත්වයන් හා සංස්ථා ... ... | 16,58,369 | 03 | | |
| වෙළෙඳ බැංකු ... | 10,27,86,453 | 32 | | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ... | 12,88,88,667 | 41 | | |
| අනිකුත් ... ... | 29,46,906 | 39 | | |
| | | | 23,65,40,907 | 52 |
| අනිකුත් වගකීම් හා ගිණුම ... | | | 10,61,96,802 | 12 |
| | | | 1,10,10,05,738 | 41 |

**වත්කම**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| ජාත්‍යන්තර සංචිතය | | | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) ... ... | 9,37,35,823 | 30 | | |
| විදේශීය රාජ්‍ය ණයපත් ... | 9,25,31,956 | 93 | | |
| | | | 18,62,67,780 | 23 |
| දේශීය වත්කම් | | | | |
| ණය සහ අත්තිකාරම්— | | | | |
| *රජයට ... ... | 21,14,33,945 | 01 | | |
| අනිකුත් අයට ... | 10,00,000 | 0 | | |
| රජයේ හා රජය සහතික කළ ණයපත් ... ... | 67,81,48,885 | 78 | | |
| | | | 89,05,82,830 | 79 |
| අනිකුත් වත්කම් හා ගිණුම් ... | | | 2,41,55,127 | 39 |
| | | | 1,10,10,05,738 | 41 |

*161 අංක 7 දරන ජාත්‍යන්තර සංවර්ධන සංගම් ගිවිසුම් පනතේ සහ සංශොධිත 1950 අංක 20 දරන බ්‍රෙටන්වුඩ ගිවිසුම් පනතේ නියමයන් ප්‍රකාර ජා. මූ.ම., ජා,ප්‍ර.ස.බැ. හා ජා.ස.ස. ට ලංකාවේ දයක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 3,93,33,945 01 ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩී. ඩබ්ලිව්. රාජපතිරාන,
අධිපති.

එස්. ඩී. අමරසිංහ,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂපත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. මහ බැංකුවේ ගිණුම් පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1961 නොවැම්බර් මස 30 වැනි දිනට බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි, ශේෂපත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

එල්. ඊ. වීරසිංහ,
ඔඩිටර් ජෙනරාල්.

1961 දෙසැම්බර් 7 වැනි දින,
කොළඹ දී ය.

12–608

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටන් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රාපිතයි.